# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 767/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 06/05/2024<br>පැය 1350 |

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.05.05 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 292 | 470 | බුලි 01<br>යකඩ බැරල් 06<br>ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01<br>තඹ දඟර 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. පුද්ගලයෙකුට වෙඩි තැබීම සඳහා වෙඩික්කරුවන් විසින් යොදා ගත් බවට සැකකරන යතුරු පැදිය සොයා ගැනීම - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.05.05 වන දින දහවල් කාලයේ හොරණ පොලිස් වසමේ හොරණ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර 2024.05.05 වන දින බෙල්ලන්ඩ් වත්ත ප්‍රදේශයේ පුද්ගලයෙකුට වෙඩි තැබීම සඳහා වෙඩික්කරුවන් විසින් යොදා ගත් බවට සැකකරන යතුරු පැදිය සොයාගෙන හොරණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

හොරණ පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.05.05 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සපුගස්කන්ද පොලිස් වසමේ හෙයියන්තුඩුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 16 මිලි ග්‍රෑම් 550 ක්, ඩිජිටල් තරාදියක්, එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 24,800/- ක් යතුරු පැදියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන සපුගස්කන්ද පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 38 ක් වූ හෙයියන්තුඩුව ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.

2024.05.05 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුත්තලම පොලිස් වසමේ පුත්තලම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 50 ක් වූ පුත්තලම** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. විදේශීය දුම්වැටි සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.

2024.05.05 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කිලිනොච්චිය පොලිස් වසමේ උදයනගර් ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත දුම්වැටි 610 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 65 ක් වූ කිලිනොච්චිය** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.

2024.05.05 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තඹලගමුව පොලිස් වසමේ ගල්මැටියාව ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තඹලගමුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 22 ක් වූ කන්තලේ** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. තඹලගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**